# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2488/39 - 2026 මැයි මස 13 වැනි බදාදා - 2026.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

64(1) වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 64 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍ය, වෛද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ වන මම කුරුණෑගල මහ නගර සභාව විසින් පවත්වා ගෙන යනු ලබන විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජලය බෙදා හැරීමේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගැනීම සම්බන්ධයෙන් එකී පනතේ 63 (1) වන වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධි විධාන මෙම නියමය මගින් මෙහි පහත උපලේඛනයේ ඇතුළත් කරමි.

**වෛද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ,**
නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍ය.

2026 මැයි මස 05 වැනි දින,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර II,
බත්තරමුල්ල,
නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී,

**උපලේඛනය**

61 (01) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ ඇතුළත් දේ.

(අ) පහත දැක්වෙන සියලුම චංචල හා නිශ්චල දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය සතු කළ යුතුය. එනම්:

i. උපලේඛන 01 හි සඳහන් සියලුම ජල නල

ii. කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි ජලය බෙදාහැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම පිළිබඳව කුරුණෑගල මහ නගර සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තුද සභාවේ අයිතිවාසිකම් හා වගකීම් මණ්ඩලය වෙත පවරනු ලැබේ.


1A - G 46774 — 04 (2026/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ඉහත සඳහන් දේපළ හා සම්බන්ධව සැලසුම් කිරීම, සවි කිරීම් ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව කුරුණෑගල මහ නගර සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තුද, සභාවේ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඇ) ජලය භාවිතා කිරීම හා ජල සේවා සැපයීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයින් සමග කුරුණෑගල මහ නගර සභාව බැඳී ඇති සියලුම ගිවිසුම් ද ඒ සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් කළ යුතු ගෙවීම් ද මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඈ) රුපියල් 1,036,233,455.45ක් වටිනා මේ පහසුකම්වල වත්කම් ආධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබේ.

(ඉ) ජලය සැපයීම් සම්බන්ධයෙන් කුරුණෑගල මහ නගර සභාව ඇතුළත් වූ සියලුම ගිවිසුම මණ්ඩලය විසින් නොකඩවා පවත්වා ගෙන යනු ලබන අතර, ගිවිසුම සපුරාලීමද කරනු ලැබේ.

ඉහත පැවරුම මෙම නිවේදනය පළ වූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

**උපලේඛනය 01**

| *අනු අංකය* | *විස්තරය* | *දිග (m)* |
|---|---|---|
| 1 | 225mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කවුඩාවත්ත ප්‍රදේශය | 664.34 |
| 2 | 110mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කවුඩාවත්ත ප්‍රදේශය | 293.21 |
| 3 | 90mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කවුඩාවත්ත ප්‍රදේශය | 1,437.95 |
| 4 | 63mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කවුඩාවත්ත ප්‍රදේශය | 5,150.85 |
| 5 | 160mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කුඩාගල්ගමුව ප්‍රදේශය | 1,483.77 |
| 6 | 110mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කුඩාගල්ගමුව ප්‍රදේශය | 1,477.11 |
| 7 | 90mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කුඩාගල්ගමුව ප්‍රදේශය | 4,831.62 |
| 8 | 63mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - කුඩාගල්ගමුව ප්‍රදේශය | 5,022.62 |
| 9 | 160mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - මල්ලවපිටිය ප්‍රදේශය | 1,471.90 |
| 10 | 110mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - මල්ලවපිටිය ප්‍රදේශය | 1,227.72 |
| 11 | 90mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - මල්ලවපිටිය ප්‍රදේශය | 3,955.75 |
| 12 | 63mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - මල්ලවපිටිය ප්‍රදේශය | 3,186.29 |
| 13 | 225mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - යන්තම්පලාව ප්‍රදේශය | 190.00 |
| 14 | 160mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - යන්තම්පලාව ප්‍රදේශය | 233.19 |
| 15 | 110mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - යන්තම්පලාව ප්‍රදේශය | 1,376.10 |
| 16 | 90mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - යන්තම්පලාව ප්‍රදේශය | 4,449.36 |
| 17 | 63mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - යන්තම්පලාව ප්‍රදේශය | 3,623.36 |
| 18 | 160mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - වැල්ලව ප්‍රදේශය | 2,597.05 |
| 19 | 110mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - වැල්ලව ප්‍රදේශය | 1,940.13 |
| 20 | 90mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - වැල්ලව ප්‍රදේශය | 7,516.59 |
| 21 | 63mm විෂ්කම්භයෙන් යුත් බෙදාහැරීම් නල මාර්ග පද්ධතිය - වැල්ලව ප්‍රදේශය | 5,937.04 |

EOG 05 - 0076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.